# නූතනත්වයේ විකාශය හා බොරුව

අපි තවදුරටත් නූතනත්වය ගැන කතාකරමු. ජ වි පෙ බෙදීම තේරුම් ගැනීමට ඒ අවශ්‍ය වෙයි. නූතනත්වය විසින් කරන ලද්දේ පුද්ගලයා - සමාජය යන ද්විමය ප්‍රතිපක්ෂයේ (බයිනරි ඔපසිෂන්) හෙවත් ද්විකෝටිකයේ පුද්ගලයා ප්‍රධානත්වයට පත්කිරීම, පුද්ගලයාගේ ඉන්ද්‍රිය පිනවීම ජීවිතයේ මූලික අංගය බවට පත්කිරීම, සංයුක්තය වෙනුවට වියුක්තය ප්‍රධාන කෝටිකය බවට පත්කිරීම, පුද්ගලයන් එකිනෙකාගෙන් වෙන්කිරීම, එලෙස ම විෂය එකිනෙකින් වෙන්කිරීම, සංස්ලේෂණය වෙනුවට විශ්ලේෂණය ප්‍රධාන කිරීම ආදිය ය. මේ සියල්ල කතෝලික චින්තනයට එරෙහිව පැන නැගුණු දෑ විය. අප කලින් සඳහන්කරන ලද ආකාරයට බටහිරයන් සිතන්නේ ද්විමය ප්‍රතිපක්ෂවලිනි. ඒ බව ඩෙරීඩා පඬිවරයා ද සඳහන්කර ඇත. එයට හේතුව බටහිරයන් ඇරිස්ටෝටිල්ගේ ගේ ද්විකෝටික න්‍යාය අනුගමනයකිරීම ය. කතෝලික චින්තනයෙහි ඒ ඒ ද්විමය ප්‍රතිපක්ෂයෙහි ප්‍රධාන තැන ගත් දෙයට විරුද්ධව අනෙක් කරුණ ප්‍රධානත්වයට ගැනීම පුනරුදය යනුවෙන් හැඳින්වෙන චින්තන විප්ලවයෙහි දී බොහෝ විට සිදු වී ඇත. මෙහි දී සඳහන්කළ යුතු කරුණක් නම් කතෝලික චින්තනයෙහි දෙවියන් වහන්සේ ගැන සඳහන්කිරීමේ දී ත්‍රිකෝටික න්‍යාය යොදා ගැනීම ය. ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේත් උන්වහන්සේගේ පුත්‍රයාත් වන්නේ ත්‍රිකෝටික න්‍යාය අනුව ය.

අද මානව අයිතිවාසිකම් යනුවෙන් හැඳින්වෙන්නේ  එකිනෙකාගෙන් හා සමාජයෙන් වෙන්කෙරුණු පුද්ගලයන් අනෙක් පුද්ගලයන්ට හා සමාජයට එරෙහිව දිනාගත් පුද්ගල අයිතීන්ගේ විකාශයකි. පුද්ගලයන් හා වෙනත් දෑ එකිනෙකින් වෙන්කිරීම විශ්ලේෂණය (සංස්ලේෂණයෙහි දී සිදුවන එකතුකිරීම වෙනුවට කොටස්වලට කඩා වෙන්කිරීම) ආදිය අද සමාජයෙහි ඉතා තදින් මුල් බැසගෙන ඇත. කලින් තිබූ නෑදෑයන් එකට ජීවත් වූ විස්තෘත පවුල වෙනුවට පියා මව හා දරුවන්ගෙන් සමන්විත න්‍යෂ්ටික පවුල ඇති වී ඇත්තේ මේ වෙන්කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ය. මේ වෙන්කිරීම තවදුරටත් විකාශය වෙයි. අද න්‍යෂ්ටික පවුල පවා විසිරී යෑමේ අවදානමට මුහුණ පා ඇත. අද ඇතැම් විට පවුලෙහි සාමාජිකයන් ජීවත්වන්නේ එකම නිවසක වුව ද සමස්ත පවුලක් ලෙස නොව නවාතැනක (බෝඩිමක) සිටින නේවාසිකයන් (බෝඩිං කාරයන්) මෙනි. තව කල්යන විට මේ තවදුරටත් විකාශය වනු ඇත.

අද ලෝකයෙහි විශ්වවිද්‍යාල ඇත්නම් ඒ ඉතා ස්වල්පයක් විය යුතු ය. බටහිර අව්වුවේ විශ්වවිද්‍යාල යනු යුරෝපීය මධ්‍යකාලයෙහි කතෝලික චින්තනය පදනම්කර ගනිමින් බිහි වූ ආයතන ය. ඒ ආයතනවල පීඨ තිබුණේ පුද්ගලයකුගේ ඉන්දිය මෙනි. පීඨ යන්නට ඉංගිරිසියෙන් කියන ෆැකල්ටි යන්නෙහි තේරුම ද ඉන්ද්‍රිය යන්න ය. පුද්ගලයෙක් තම ඉන්ද්‍රිය මඟින් ලබාගන්නා දැනුම එකතුකර (අනුකලනයකර) එක දැනුමක් බවට පත්කර ගනියි. අවශ්‍ය නම් එයට සමායෝජනය යැයි කිව හැකි ය. අප කණින් ලබාගන්නා දැනුම ඇහෙන් ලබාගන්නා දැනුම සමග සමායෝජනය නොකරන්නේ නම්, ඇහෙන් ලබාගන්නා දැනුම ස්පර්ශයෙන් ලබාගන්නා දැනුම සමග සමායෝජනය නොකරන්නේ නම් කුමක් සිදුවේ ද? එවැනි තත්වයක අපට ඇවිදීමට වුව ද නො හැකි ය.

අද ඒ ඒ විෂයයෙහි විශේෂඥයෝ වෙති. ඔවුහු එකිනෙකාගෙන් වෙන් වී සිටිති. එකල ලංකාවේ සෑම ගෘහිණියක් ම වෛද්‍යවරියක් වූවා ය. ඔවුහු රෝගවලට අත්බෙහෙත් දැන සිරියහ. එහෙත් අද අපට ඒ ඒ රෝගයට විශේෂඥයෝ සිටිති. නාසයට වෙදකම්කරන්නාට බඩට වෙදකම්කළ නො හැකි ය. ඒ ඒ ක්ෂෙත්‍රයෙහි ඊනියා ශාස්ත්‍රීය සංවිධාන ගොඩනගාගෙන ඒවාහි සාමාජිකයන් ඒ ඒ විෂයයෙහි පොල්ම:කරුවන් උරුමක්කරුවන් බවට පත් වී ඇත. නීතිය නීතිඥයන් ලෙස ලියාපදිංචි වූවනට අයත් වෙයි. වෛද්‍ය වෘත්තිය ද ඉංජිනේරු වෘත්තිය ද එබඳු ය. එපමණක් නො වේ. රසායන විද්‍යාවේ ද, භෞතික විද්‍යාවේ ද, ජීව විද්‍යාවේ ද, සමාජයීය විද්‍යාවන්හි ද එවැනි සංගම් ඇත. වාර්ෂික ව පල්ලියේ පූජකයන් මෙන් රතු සහ වෙනත් වර්ණවල ලෝගුවලින් සැරසී පැමිණෙන සංගම් සාමාජිකයෝ මහත් උජාරුවෙන් තමන් අන්‍යයන්ගෙන් වෙනස් බව ප්‍රදර්ශනයකරමින් වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වති.

මධ්‍යකාලීන යුරෝපීය විශ්වවිද්‍යාලවල තිබූ අනුකලිත (ඉන්ටග්‍රේටඩ්) දැනුම අද විශ්වවිද්‍යාල යැයි කියන ආයතනවල දක්නට නො මැත. විෂය එකිනෙකින් වෙන් වී පීඨවල ද අධ්‍යයන අංශවල ද කොටු කර ගාල් කෙරී ඇත. මෙරට විශ්වවිද්‍යාලවල එක් පීඨයක ආචාර්යවරයකුට තවත් පීඨයක ආචාර්යවරයකු සමග කතාකිරීමට ඇති පොදු මාතෘකාව තම තමන් ළඟ දී ආනයනය කරන ලද වාහන ය. මෙය ලංකාවට පමණක් සීමා වූ කරුණක් නො වෙයි. සී

© Prof. Nalin De Silva

පී ස්නෝ මහතා දශක කිහිපයකට පෙර බටහිර රටවල, විශේෂයෙන් ම එංගලන්තයේ තිබූ මේ තත්වය විස්තර කරමින් සංස්කෘති දෙකක් (ටූ කල්චරස්) නම් පොත පළකෙළේ ය. ඒ මහතා ඉන් පෙන්නුම්කෙළේ විද්‍යා හා ශාස්ත්‍ර හැදෑරූ අය සංස්කෘති දෙකක අය මෙන් හැසිරෙන බව ය. ඔවුන්ට පොදු මාතෘකා නොතිබුණි.

අවුරුදු හතළිහකට පමණ පෙර අඩුම තරමින් එක් විෂයයක හෝ අනුකලිත දැනුමක් විශ්වවිද්‍යාලවල ඉගැන්විණි. අද ඒ තත්වය දක්නට නැත. අද විෂයය ද කැඩී බිඳී ගොස් ය. ඒ වෙනුවට ඇත්තේ පාඨමාලා ඒකක ය. අද සිසුහු පාඨමාලා ඒකකවලින් සම්භාර (ක්‍රෙඩිට්) එකතු කරති. මෙයට විරුද්ධව කෑ කෝ ගැසීමෙන් පලක් නැත. වර්තමානයෙහි කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයේ ද වෙනත් ආයතනවල (විශ්වවිද්‍යාලවල පමණක් නොව) අවුරුදු දෙකක් ගතකර සම්භාර එකතුකර තුන්වැනි අවුරුද්ද පමණක් එහි ගතකර තවත් සම්භාර කිහිපයක් එකතුකරගෙන උපාධියක් ලබාගත හැකි ය. නූතනත්වයේ වෙන්කිරීම එබඳු ය. අද විශ්වවිද්‍යාල ගුරුවරයකු කළ යුත්තේ එයට විරුද්ධවීම නොව තම දේශනවල වෙනත් විෂය ගැන ද කතාකිරීම ය. ගණිතය ඔස්සේ තමන් උගන්වන ඒකකයෙහි ඉතිහාසය, එහි සම්භවය, ගණිතයෙහි අනෙක් ඒකක හා අදාළ ඒකකය අතර ඇති සම්බන්ධය, ඒ ඇතිවුණු සමාජ වාතාවරණය, එයට පසුබිම් වූ දර්ශනය, දේශපාලනය ආදිය පමණක් නොව අවශ්‍ය නම් දොස්තොවුස්කිගේ නවකතාවල හා අයින්ස්ටයින්ගේ සාපේක්ෂතාවාදයෙහි වියුක්තබව නිසා ඇතිවන අන්තර්සම්බන්ධය ද අයින්ස්ටයින්ගේ වියුක්ත අවකාශ කාල සාපේක්ෂතාව හා පිකාසෝගේ වියුක්ත (ඇබ්ස්ට්‍රැක්ට්) චිත්‍රවල අවකාශය සාපේක්ෂව යොදාගෙන ඇති ආකාරය අතර සම්බන්ධය ද ඉගැන්විය හැකි බව මම දන්නෙමි. මේ සියල්ලට කාලය හා අවකාශය හරස් වෙයි. එහෙත් ඒ සාපේක්ෂ බැවින් අවශ්‍ය නම් එයට විසඳුමක් සොයාගත හැකි ය.

නූතනත්වයේ වෙන්කිරීම තිබිය දී ද එසේ ඉගැන්විය හැක්කේ මොන තරම් වෙන්කිරීමට තැත්කළ ද විවිධ ඒකක හා විවිධ විෂය අතර පදනම් සංස්කෘතිය හා චින්තනය එකක් වීම ය. පසුගිය සියවස් පහක පමණ කාලයෙහි මුළු මහත් බටහිර දැනුම ම බිහි වී ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම්කර ගනිමිනි. වෙන්කිරීම මේ සංස්කෘතියෙහි හා චින්තනයෙහි අංගයක් වෙයි. එහෙත් වෙන්කරන්නේ එක් සංස්කෘතියක හා චින්තනයක මිස සංස්කෘති දෙකක තුනක නො වෙයි. අප පදනම් සංස්කෘතිය හා චින්තනය දන්නේ නම් අනුකලිත දැනුම ලබාගැනීම අපහසුවක් නො වෙයි. බටහිර රටවල ආගම හා රාජ්‍යය වෙන්කෙරී ඇතැයි බටහිර දේශපාලන විද්‍යාඥයන් ප්‍රකාශකරන විට අප එයට විරුද්ධ වන්නේ ඒ දෙකම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි උපත ලබාඇති බැවින් රූපයෙන් කෙසේ වුවත් හරයෙන් වෙන්කළ නොහැකි බැවිනි. එසේ ම බටහිර විද්‍යාව වාස්තවික (ඔබ්ජෙක්ටිව්) යැයි කීම පට්ටපල් බොරුවක් යැයි අප ප්‍රකාශකරන්නේ ඒ විද්‍යාව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියක ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය පදනම් කරගනිමින් බිහිකෙරී ඇති බැවිනි. මට ආචාර්ය උපාධිය ලැබුණේ විශ්වවේදයේ (කොස්මොලොජි) මහා පිපුරුම (බිග් බෑන්) ආශ්‍රිත කරුණු කිහිපයක් අධ්‍යයනය කිරීම වෙනුවෙනි. මහා පිපුරුම ද පට්ටපල් බොරුවක් බවත් ඉන් කෙරෙන්නේ එක් පැත්තකින් නිර්මාණවාදය තහවුරුකිරීමක් බවත් අද මම දනිමි. එහෙත් බොරුවට වුවත් දුන් උපාධිය මා ප්‍රතික්ෂෙප නොකරන්නේ ඒ ඔස්සේ මට වෙනත් දේ ද ඉගැන්විය හැකි බැවිනි. අඳුර ආලෝකනනය ලෙස උගන්වන නූතනත්වයක එවැනි දේ සිදුවෙයි.

බටහිර ප්‍රජාතන්ත්‍රවාදය තරම් බොරුවක්, රැවටීමක් තවත් වේ ද? ප්‍රජාතන්ත්‍රවාදය යන්න හරිහැටි උච්චාරණයකිරීමට නොහැකි දේශපාලනඥයෝ ඒ වෙනුවෙන් පෙනී සිටිති. බොරු කියති. එපමණක් නොව මිනී මරති. ප්‍රජාතන්ත්‍රවාදය ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බිහිවුවකි. බටහිර රාජාණ්ඩු තිබූ කාලයෙහි පාලනය හිමිවූයේ උත්පත්තියෙන් ඒ සඳහා “ සුදුසුකම් ” ලැබූවන්ට ය. එකල ප්‍රධාන සාධකය වූයේ උත්පත්තිය ය. අද ඒ සඳහා “සුජාත” උත්පත්තියක් අනවශ්‍ය වෙයි. එහෙත් ඕනෑම කෙනකුට අද දේශපාලනයෙහි නිරත විය නො හැකි ය. අද ඒ සඳහා වෙනත් අවශ්‍යතා සපුරාලිය යුතු වෙයි. එහි දී ප්‍රධාන ම සාධක වන්නේ සංස්කෘතිය හා මුදල් ය. මේ දිනවල ඇමරිකා එක්සත් ජනපදයෙහි ජනාධිපතිවරණයෙහි ඩිමොක්‍රටික් පක්ෂයෙහි අපේක්ෂකයා තෝරාගැනීම සඳහා ප්‍රාථමික යනුවෙන් හැඳින්වෙන ඡන්දයක් පැවැත්වෙයි. අද ඒ තරගය පැවැත්වෙන්නේ හිලරි ක්ලින්ටන් මහත්මිය හා භරක් ඔබාමා මහතා අතර ය. ඇතැමුන්ට සිතෙන්නේ කළු ජාතිකයකු වූ ඔබාමාට තරගකිරීමට අවස්ථාව ලබා දී ඇති ඇමරිකාව ඉතාමත් ප්‍රජාතන්ත්‍රවාදී රටක් බව ය. එහෙත් ඔබාමා මහතා මුස්ලිම් වී නම් ඔහුට ඒ අවස්ථාව ලැබේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva